සැ. යු. - මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2015.12.31 දින දක්වා ලියාපදිංචි පශු වෛද්‍ය නිලධාරීන්ගේ නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළ වේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,962 - 2016 අප්‍රේල් මස 08 වැනි සිකුරාදා - 2016.04.08**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : (IIආ) වැනි ඡෙදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)

| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | 544 | රජයේ නොවන දැන්වීම් ... ... ... | 551 |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — | රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 549 | වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 555 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — | | |

සැ. යු. - රුහුණු උද්‍යානය සංවිධානය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2016 ජනවාරි මස 01 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2016 අප්‍රේල් මස 29 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2016 අප්‍රේල් මස 15 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ඩබ්ලිව්. ඒ. ඒ. ජී. ෆොන්සේකා,**
රජයේ මුද්‍රණාලයාධිපති *(වැ. බ.).*

2016 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම්

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

**Electrical Motor Driven Air Cooled Silence Screw Type Compressors ගණනකින් 06ක් සැපයීම, ස්ථාපනය කිරීම සමග ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F7286

01. කොළඹ තැ. පෙ. 355 හි දුම්රිය මූලස්ථානයේ ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ, සභාපති විසින්, විදුලි මෝටරයෙන් ධාවනය වන, වායු සිසිලින නිහඬ screw (ස්කෲ) මාදිලියේ සම්පීඩක යන්ත්‍ර ගණනින් 06ක් ශ්‍රී ලංකා දුම්රිය සේවයට සැපයීම, ස්ථාපනය කිරීම සහ ක්‍රියාත්මක කර පෙන්වීම සඳහා නිෂ්පාදකයින්/ සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. නිෂ්පාදකයින් හට, ස්වකීය ලංසු ඔවුන් විසින් ඇටර්නි බලය මගින් බලය පවරන ලද සිය බලයලත් ඒජන්තවරුන් මාර්ගයෙන් ලංසු ඉදිරිපත් කළ හැකි ය.

02. ලංසු භාර ගැනීම 2016.05.04 වැනි දින ප. ව. 2.00 ට අවසන් වනු ඇත.

03. ලංසු ආපසු ගෙවනු නොලබන රුපියල් 2,500 ක් (දෙදහස් පන්සියයක්) පමණක් වන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, 2016.05.03 වැනි දින ප. ව. 3.00 දක්වා ශ්‍රී ලංකාවේ කොළඹ 10 හි ඕල්කොට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලංසු ලිපිලේඛන සමග ලබාගත හැකි ආකෘතිපත්‍ර (පෝර්ම) මත ඉදිරිපත් කළ යුතු ය.

04. ලංසු එම ලංසු භාරගන්නා වේලාව අවසන් වූ වහාම ශ්‍රී ලංකාවේ, කොළඹ 10, දුම්රිය මූලස්ථානයේ, කාර්යාලයේ දී විවෘත කරනු ලැබේ. එම ලංසු විවෘත කරණු ලබන අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට පැමිණ සිටීමට අවසර ඇත.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනවිත් භාරදීම හෝ සිදු කළ යුතු ය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී නොමිලේ (ගාස්තු ගෙවීමකින් තොරව) පරීක්ෂා කර බැලිය හැකි ය.

07. වැඩිදුර විස්තර සඳහා කරුණාකර විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරි
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කට් මාවත,
කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 94 (11) 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F 7286

04-478

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ලංසු දැන්වීම

**මධ්‍යම දිස්ත්‍රික්කයේ ඇති භාවිතයෙන් ඉවත් කළ (අබලි) දුම්රිය පීලි (Rails) අපහරණය කිරීම (Disposal)**

01. කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයේ, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන) හි සභාපති විසින්, මධ්‍යම දිස්ත්‍රික්කයේ (Central District) තබා ඇති දික් අඩි (Linear Feet)) 5.356 ක් වන, ඉවත ලන ලද (Discarded) රේල් පීලි (Rails) අපහරණය කිරීම (Disposal) සඳහා මුද්‍රා තබන ලද ලංසු මෙයින් කැඳවනු ලැබේ. එහි විස්තර පහත සඳහන් පරිදි වේ.

| *පිහිටීම* | *ප්‍රමාණය* | |
|---|---|---|
| | Check Rails | Rails (uncut) |
| බලන | 1,390'00" | 330'00" |
| කඩුගන්නාව | 952'00" | 2,684'00" |
| මුළු ගණන | 2,342'00" | 3,014'00" |
| අර්පණිත (offered) | | |
| රේල් පීලි වල මුළු දිග | | 5.356'00" |

02. ලංසු භාර ගැනීම 2016.04.20 දින ප.ව. 2.00 ට අවසන්වේ.

03. ලංසු, දුම්රිය සේවයේ, ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙත ගෙවිය යුතු ආපසු ගෙවනු නොලබන රුපියල් පන්දහස් (රු.5,000.00) පමණක් වන ලිපිලේඛන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව, 2016.04.19 වැනි දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලය වෙතින්, ලබාගත හැකි ආකෘතිපත්‍ර (ෆෝර්ම) මත ඉදිරිපත් කළ යුතුය.

04. ලංසු කොළඹ10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථාන කාර්යාලයේ දී, එම ලංසු භාරගන්නා වේලාව ඉක්මවූ වහාම විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරනු ලබන එම අවස්ථාවට ලංසුකරුවන්ට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින් හට පැමිණ සිටීමට අවසර ඇත.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ අතින් ගෙනැවිත් භාරදීම හෝ කළ යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය,
ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලිපිලේඛන කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී නොමිලේ (ගාස්තු ගෙවීමකින් තොරව) පරීක්ෂා කර බැලිය හැකිය.

07. වැඩිදුර විස්තර සඳහා, කරුණාකර, දුරකථන අංක 011-2438078/011-2436818, මගින් කොළඹ10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරී වෙතින්, විමසනු මැනවි.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු (ප්‍රධාන),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.6923

04-466

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන නිවේදනය

**රත්මලාන දුම්රිය අංගනයෙහි ඇති භාවිතයෙන් ඉවත්කරන ලද ස්ටීල් ටයර්, ඩිස්ක් සහ භාවිතයෙන් ඉවත් කරන කොයිල් ස්ප්‍රිං බැහැර කිරීම**

SRS/F. 7330

01. රත්මලාන දුම්රිය අංගනයෙහි ඇති භාවිතයෙන් ඉවත් කරන ලද ස්ටීල් ටයර්, ඩිස්ක් සහ භාවිතයෙන් ඉවත් කරන ලද කොයිල් ස්ප්‍රිං බැහැර කිරීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයෙහි, ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (මේජර්) විසින් මුද්‍රා තබන ලද ලංසු සඳහා ආරාධනය කරනු ලබයි.

02. 2016.04.27 දින ප.ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන් වේ.

03. ලංසු ඉදිරිපත් කළ යුත්තේ රු. 10,000.00 (රුපියල් දස දහසක) ආපසු ගෙවනු නොලබන ලියකියවිලි ගාස්තුවක් දුම්රිය සේවා ප්‍රධාන ගණකාධිකාරී කාර්යාලය වෙත ගෙවා 2016.04.26 දින ප.ව. 3.00 දක්වා කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයෙන් ලබාගත හැකි පෝර්මවලය.

04. ලංසු විවෘත කිරීම ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේ දී සිදුකරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගී වන ලෙස ලංසු තබන්නන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට ආරාධනය කරනු ලබයි.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව සිදු කළ හැකිය.

07. වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවෙහි දුම්රිය ගබඩා අධිකාරී අමතන්න.

දුරකථන අංක : 2438078/2436818
ෆැක්ස් :2432044
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය :www.railway.gov.lk

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7330

04-465

---

## ශ්‍රී ලංකා දුම්රිය සේවය

### ප්‍රසම්පාදන නිවේදනය

**ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ආනයනය කරන දෑ පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂකවරුන් පත්කිරීම සඳහා වන ප්‍රසම්පාදනය**

ප්‍රසම්පාදන අංකය : SRS/F. 7328.

01. ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ආනයනය කරන ලද දෑ පරීක්ෂා කිරීම සඳහා පරීක්ෂකවරුන් පත්කර ගැනීම පිණිස නැව්බඩු පරීක්ෂා කිරීමේ කාර්යයෙහි යෙදී සිටින පිළිගත් සංවිධානවලින් කොළඹ 10,

ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (මේජර්) විසින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලබයි.

02. ලංසු ඉදිරිපත් කළ යුත්තේ රු.2,500.00 ක ආපසු නොගෙවන ලියකියවිලි ගාස්තුවක් හෝ ඒ හා සමාන පහසුවෙන් පරිවර්තනය කළ හැකි මුදලක් ගෙවීමෙන් 2016.05.09 දින ප.ව. 3.00 දක්වා (ශ්‍රී ලංකා වේලාවෙන්) කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් හෝ ශ්‍රී ලංකා විදේශ දූත මණ්ඩල වලින් ලබාගත හැකි පෝරමවල පමණි.

03. 2016.05.10 දින ප.ව. 2.00 ට (ශ්‍රී ලංකා වේලාව) ලංසු භාරගැනීම අවසන්වේ.

04. ලංසු විවෘත කිරීම ලංසු භාරගැනීම අවසන් වූ වහාම කොළඹ 10, ඕල්කට් මාවතේ, ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි මූලස්ථානයේ දී සිදුකරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට පැමිණෙන ලෙසට ලංසු තබන්නන්හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට ආරාධනය කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව, (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව සිදුකළ හැකි අතර, වැඩිදුර විස්තර සඳහා මෙසේ විමසන්න.

දුම්රිය ගබඩා අධිකාරි,
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
ඕල්කට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

දුරකථන අංක : 94 (11) 2438078 හෝ 2436818
ෆැක්ස් අංකය : 94 (11) 2432044

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව(මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

යොමු අංකය : SRS/F.7328

04-464

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන නිවේදනය

**රාගම සහ මරදාන දුම්රිය ගබඩාවෙහි භාවිත කළ හැකි සහ භාවිතා කළ නොහැකි හිස් බැරල් ඉවත ලන තෙල් සමඟ අපහරනය කිරීම**

01. රාගම දුම්රිය ගබඩාවෙහි ඇති භාවිතා කළ හැකි සහ භාවිතා කළ නොහැකි හිස් බැරල් 1154 කින් සහ රාගම දුම්රිය ගබඩාවෙහි ඇති ඉවත ලන තෙල් බැරල් 12 කින් සමන්විත බැරල් 1166 ක් ලොට් පදනමින් සහ මරදාන දුම්රිය ගබඩාවෙහි ඇති භාවිතයට ගත හැකි හිස් බැරල් 1200 ක් ඒකක පදනමින් බැහැර කිරීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය, මූලස්ථානයෙහි, ශ්‍රී ලංකා දුම්රිය සේවයෙහි දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටු සභාපති (මේජර්) විසින් ලංසු භාරගනු ලබයි.

02. 2016.04.26 දින ප.ව. 2.00 ට ලංසු භාරගැනීම අවසන්වේ.

03. ලංසු ඉදිරිපත් කළ යුත්තේ රු. 2,500 (රුපියල් දෙදහස් පන්සීයයක) ආපසු ගෙවනු නොලබන ලියකියවිලි ගාස්තුවක් 2016.04.25 දින ප.ව. 3.00 දක්වා, කොළඹ 10, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයෙන් ලබාගත හැකි පෝරමවල පමණි.

04. ලංසු විවෘත කිරීම ලංසු භාර ගැනීම අවසන්වූ වහාම, කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය මූලස්ථානයේදී සිදුකරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට සහභාගිවන ලෙස ලංසු තබන්නන් හට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන්ට ආරාධනය කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් හෝ අතින් ගෙනැවිත් භාරදිය යුතුය.

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්)
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
දුම්රිය මූලස්ථානය, ඕල්කට් මාවත, කොළඹ 10.

06. ලංසු ලියකියවිලි පරීක්ෂා කිරීම කොළඹ 10, ඕල්කට් මාවතේ, දුම්රිය ගබඩා අධිකාරි කාර්යාලයේ දී ගාස්තු ගෙවීමකින් තොරව සිදු කළ හැකිය.

07. මේ පිළිබඳ වැඩිදුර විස්තර දැන ගැනීම සඳහා කොළඹ 10, ඕල්කට් මාවතේ දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුවේ දුම්රිය ගබඩා අධිකාරි අමතන්න.

දුරකථන අංක : 94 (11) 2438078/2436818
ෆැක්ස් අංක : 94 (11) 2432044

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව (මේජර්),
ශ්‍රී ලංකා දුම්රිය සේවය,
යොමු අංකය : SRS/F. 7332

04-463

---

**ශ්‍රී ලංකා දුම්රිය සේවය**

ප්‍රසම්පාදන දැන්වීම

01. ශ්‍රී ලංකාව, කොළඹ, තැ. පෙ. 355, දුම්රිය මූලස්ථානය, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින්, ශ්‍රී ලංකා දුම්රිය සේවය සඳහා ටෆ් පිච් කොපර් ඉන්ගොට් (Tough Pitch Copper Ingots) මෙ. ටො. 10 ක් ප්‍රසම්පාදනය සඳහා නිෂ්පාදකයින්/

සැපයුම්කරුවන් වෙතින් මුද්‍රා තබන ලද ලංසු භාරගනු ලැබේ. නිෂ්පාදකයින් විසින් ඇටෝර්නි බලය මගින් ඔවුන් විසින් ලිඛිතව බලය පවරන ලද ඒජන්තවරයෙකු මගින් හෝ සෘජුවම තම ලංසු ඉදිරිපත් කළ යුතුය.

02. ලංසු 2016.04.25 දින ප.ව. 2.00ට (ශ්‍රී ලංකා වේලාවෙන්) අවසන් කරනු ලැබේ.

03. කොළඹ 10, ඕල්කොට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී, වෙතින් හෝ, ශ්‍රී ලංකා විදේශ තානාපති කාර්යාල වෙතින් රු. 2,500 ක් හෝ පහසුවෙන් හුවමාරු කළ හැකි සමාන විදේශ මුදල් මගින් ආපසු නොගෙවන ප්‍රසම්පාදන ගාස්තුවක් ගෙවීම මත ලබාගන්නා ලද ආකෘති පත්‍ර මගින් පමණක් 2016.04.22 (ශ්‍රී ලංකා වේලාවෙන්) ප.ව. 3.00 දක්වා ලංසු ඉදිරිපත් කළ යුතුය.

04. ලංසු අවසන් කිරීමත් සමගම වහාම, ශ්‍රී ලංකාව, කොළඹ 10, ඕල්කොට් මාවත, ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානයේ දී ලංසු විවෘත කරනු ලැබේ. ලංසුකරුවනට හෝ ඔවුන්ගේ බලයලත් නියෝජිතයින්ට ලංසු විවෘත කිරීමේ අවස්ථාවට සහභාගී වන ලෙස ආරාධනය කරනු ලැබේ.

05. මුද්‍රා තබන ලද ලංසු ලියාපදිංචි තැපෑලෙන් හෝ පෞද්ගලිකව එවිය යුත්තේ,

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය, දුම්රිය මූලස්ථානය,
ඕල්කොට් මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.

06. ලංසු ලිපිලේඛන, ශ්‍රී ලංකාවේ, කොළඹ 10, ඕල්කට් මාවත, දුම්රිය ගබඩා අධිකාරී කාර්යාලයේ දී නොමිලේ පරීක්ෂා කර බැලීමට පුළුවන.

07. වැඩි විස්තර සඳහා විමසන්න.
දුම්රිය ගබඩා අධිකාරී,
දුම්රිය ගබඩා දෙපාර්තමේන්තුව,
තැ. පෙ. 1347, ඕල්කොට් මාවත, කොළඹ, ශ්‍රී ලංකාව.

දුරකථන අංකය : 94 (11)2438078 හෝ 94 (11) 2436818
ඊමේල් : srs.slr@gmail.com
වෙබ් අඩවිය : www.railway.gov.lk

යොමු අංකය : SRS/F. 7262

සභාපති,
දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව,
ශ්‍රී ලංකා දුම්රිය සේවය.

04-477

**ඉඩම් අමාත්‍යාංශය**

ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුව

**පාවිච්චි කළ භාණ්ඩ විකිණීම සඳහා ලංසු කැඳවීම**

01. ශ්‍රී ලංකා මිනින්දෝරු දෙපාර්තමේන්තුවට අයත් ප්‍රයෝජනයට ගත නොහැකි යැයි නිර්දේශ කොට ඇති පහත සඳහන් භාණ්ඩ විකිණීමට ලංසු කැඳවනු ලැබේ.

02. ලංසු ඉදිරිපත් කිරීම සඳහා අදළ ලංසු පත්‍ර කොළඹ 05, කිරුළ පාරේ අංක 150 පිහිටි සර්වේයර් ජනරාල් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්) වෙතින් ලබා ගත හැකි වන අතර, 2016 අප්‍රේල් මස 29 වැනි දින ප. ව. 3.00 තෙක් කාර්යාල වේලාවන්හි දී අදළ භාණ්ඩ ලැයිස්තුව හා භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකි භාණ්ඩ පරීක්ෂා කිරීම ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ප්‍රසම්පාදන හා සැපයීම්), ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (සිතියම් ප්‍රකාශන) සහ ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී (ගුවන් මැනුම්)ගේ අධීක්ෂණය යටතේ සිදු කළ හැකියි.

03. එක් එක් අයිතම සඳහා වෙන වෙනම සකස් කළ ලංසු පත්‍ර කවරයක බහා මුද්‍රා තබා කවරයේ ඉහල වම් කෙළවරේ ''අයිතම අංක ........................'' යන්න සඳහන් කර, එක් එක් අයිතමය වෙනුවෙන් ආපසු ගෙවනු ලබන රුපියල් දහස (රු. 1,000.00) ක තැන්පත් මුදලක් ලංසු සුරක්ෂණය වශයෙන් මෙම කාර්යාලයේ සරප් නිලධාරී වෙත 2016 මැයි මස 05 වැනි දින පෙ. ව. 10.00 ට පෙර ගෙවා ලබා ගන්නා රිසිට්පතෙහි පිටපතක් අමුණා රිසිට්පත් අංකය ලංසු පත්‍රයේ සඳහන් කර පහත සඳහන් ලංසු භාර ගැනීම අවසන් කරන වේලාවට පෙර ලියාපදිංචි තැපෑලෙන් ලැබෙන සේ ඉහත ලිපිනයට එවිය හැකි වන අතර නැතහොත් ප්‍රසම්පාදන හා සැපයීම් අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය හැකියි.

04. භාණ්ඩ විකිණීමේ දී ඉදිරිපත් කරන ලංසුවේ වටිනාකමට අමතරව එදිනට පවතින වැට් බද්ද ගැනුම්කරු විසින් ගෙවිය යුතු ය.

05. ලංසු භාර ගැනීම 2016 මැයි මස 05 වැනි දින පෙ. ව. 10.00 ට අවසන් කරන අතර එදිනම පෙ. ව. 10.05 ට ලංසු විවෘත කරන අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට සහභාගි විය හැක.

06. ප්‍රමාද වී ලැබෙන හෝ අසම්පූර්ණ ලෙස ඉදිරිපත් කර ඇති ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර මෙම විකිණීම හා සබැදි කරුණු පිළිබඳව සර්වේයර් ජනරාල් විසින් ගනු ලබන තීරණය අවසන් තීරණය වේ.

විකිණීමට යෝජිත භාවිතා කරන ලද භාණ්ඩ වර්ග :

01. පරිගණක උපාංග
02. විදුලි උපකරණ
03. වෙනත් අබලි භාණ්ඩ
04. මැනුම් උපකරණ

සර්වේයර් ජනරාල්,
සර්වේයර් ජනරාල් කාර්යාලය.

අංක 150, කිරුළපාර,
කොළඹ 05.
දුරකථන අංක : 0112 - 368106, 0112 - 369014, 0112 - 369011 - දිගුව 248
ෆැක්ස් අංකය : 0112 - 368106.

2016 අප්‍රේල් මස 08 වැනි දින.

04-439

**අධිකරණ භාරයට ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද මෝටර් රථ මුද්‍රා තැබූ මිල ගණන් කැඳවා විකිණීම පිණිස මහාධිකරණය විසින් ටෙන්ඩර් පත්‍රිකා කැඳවීම - 2016**

පොතුවිල් දිසා/මහෙස්ත්‍රාත් අදිකරණය විසින් අත්පත් කර ගන්නා ලද අයිතිකරුවන් නොමැතිව රාජ්‍ය සන්තක කරන ලද ලොරි රථ ඩිමෝ බට්ටා සහ බජාජ් පල්සර් යතුරු පැදි ප්‍රසිද්ධ මිල ගණන් කැඳවීම යටතේ විකිණීමට තිබේ. මේ සඳහා වූ ඉල්ලුම් පත්‍ර 2016 අප්‍රේල් මස 28 වැනි දින ප. ව. 3.00 දක්වා භාරගනු ලැබේ.

සියලු ඉල්ලුම්පත්‍ර මහාධිකරණ විනිසුරු, මහාධිකරණය, කල්මුණේ යන ලිපිනයට ලියාපදිංචි තැපැල් මගින් යොමු කළ යුතු ය. ලියුම් කවරයේ වම් පස ''පොතුවිල් දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය මගින් රාජසන්තක කරන ලද වාහන සම්බන්ධ ටෙන්ඩර්'' යනුවෙන් සඳහන් කළ යුතු ය.

මේ සඳහා මහාධිකරණ නිළ මුද්‍රාව හා මහාධිකරණ ගණකාධිකාරි තැනගේ අත්සන සහිත ඉල්ලුම්පත්‍ර පමණක් පාවිච්චි කළ යුතු ය.

මෙලෙස ටෙන්ඩර් පත්‍රිකා මගින් විකිණීමට තීරණය කර ඇති වාහනවල අයිතිය ඉල්ලන කවුරු හෝ සිටියි නම්, ටෙන්ඩර් පත්‍රිකා කැඳවීමේ අවසාන දිනය වන 2016 අප්‍රේල් මස 28 වැනි දින ප. ව. 3.00 ට පෙර ලේඛන සහිතව තමන්ගේ අයිතිය සම්බන්ධ වූ ඉල්ලීම ඉදිරිපත් කළ යුතු ය. එසේ කිරීමට අපොහොසත් වන්නේ නම් පසුව ඒ සම්බන්ධයෙන් කිසිදු සැලකිල්ලක් නොදක්වන බවත් දන්වා සිටිමු.

එක් එක් වාහනය සඳහා වෙන වෙන ම ඉල්ලුම්පත්‍ර ඉදිරිපත් කළ යුතු ය. ඒ සඳහා ආපසු නොගෙවනු ලබන රු. 100ක් සමඟ, පහත පරිදි තැන්පත් මුදල් තැන්පත් කළ යුතු ය. මෙම ඉල්ලුම්පත්‍ර නිකුත් කිරීම 2016 අප්‍රේල් මස 28 වැනි දින පෙ. ව. 11.30 ට අවසන් වනු ඇත.

| *අනු. අංකය* | *වාහනයේ විස්තර* | *වර්ගය* | *විකිණීම සඳහා ලබාදෙන ලද අංකය* | *තැන්පත් මුදල්* |
|---|---|---|---|---|
| 01. | ෆොටොන් ලොරි රථ - 01 | Forton - Forland | MCP/01/2016 | 2,000.00 |
| 02. | ටාටා ඩිමෝ බට්ටා - 01 | TATA - ACE | MCP/02/2016 | 5,000.00 |
| 03. | ටාටා ඩිමෝ බට්ටා - 01 | TATA - ACE | MCP/03/2016 | 5,000.00 |
| 04. | ටාටා ලොරි රථ - 02 | TATA - ACE | MCP/04/2016 | 10,000.00 |
| 05. | බජාජ් පල්සර් යතුරු පැදි - 01 | Bajaj - Pulsar - 150 | MCP/05/2016 | 1,000.00 |

වලංගු කාලය තුළ ලැබෙන මුද්‍රා සහිත සියලු ඉල්ලුම්පත්‍ර 2016 අප්‍රේල් මස 28 වැනි දින ප. ව. 3.00 ට පැමිණ සිටින ඉල්ලුම්කරුවන් ඉදිරිපිට, මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව විසින් විවෘත කරනු ලැබේ.

ටෙන්ඩර් පත්‍රිකා මගින් ඉහල මිලක් සඳහන් කොට ඉල්ලුම්කර ඇති ඉල්ලුම්කරුවන්ට එම වාහනය විකිණීමට කල්මුණේ මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව අනුමැතිය ලබාදෙනු ඇත. ඒ අනුව ඉදිරි විකිණීම් කටයුතු අදළ පොතුවිල් දිසා මහෙස්ත්‍රාත් අධිකරණය විසින් සිදු කරනු ලැබේ.

ටෙන්ඩර් කැඳවීම මගින් විකිණීමට තීරණය කර ඇති මෝටර් රථ කාර්යාල දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 2.30 දක්වා වූ කාලය තුළ අදළ පොතුවිල් දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්ගේ අවසරය මත නිරීක්ෂණය කළ හැකි ය.

විකිණීමට තීරණය කර ඇති වාහන සඳහා තක්සේරු මිල ලබාගෙන ඇති බැවින් ඉදිරිපත් කරනු ලබන ටෙන්ඩර් පත්‍රිකාවල සඳහන් මිල තක්සේරු මිලට වඩා අඩුවෙන් පවතියිනම්, එම වාහන විකිණීම අත්හිටුවා දැමීමට අධිකරණයට පූර්ණ බලය ඇත.

විකුණන ලද වාහන, මුදල් ගෙවා රිසිට් පත් ලබාගත් පසු වහාම අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. එමෙන් ම සියලු ගෙවීම් මුදලින් පමණක් සිදුකළ යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ.

නවරත්න මාරසිංහ,
මහාධිකරණ විනිසුරු,
නැගෙනහිර පළාත් බද මහාධිකරණය,
කල්මුණේ.

| *අනු. අංකය* | *නඩු අංකය* | *වාහනයේ විස්තර* | *වර්ගය* | *විකිණීම සඳහා ලබා දෙන ලද අංක* |
|---|---|---|---|---|
| 01. | 16218/F/13 | ෆොටොන් ලොරි රථ - 01 | Forton Forland | MCP/01/2016 |
| 02. | 15453/E/13 | ටාටා ඩිමෝ බට්ටා - 01 | TATA - ACE | MCP/02/2016 |
| 03. | 15871/PC/13 | ටාටා ඩිමෝ බට්ටා - 01 | TATA - ACE | MCP/03/2016 |
| 04. | 19195/F/14 | ටාටා ලොරි රථ - 01 | TATA - ACE | MCP/04/2016 |
| 05. | 17416/E/13 | බජාජ් පල්සර් යතුරු පැදි - 01 | Bajaj Pulsar - 150 | MCP/05/2016 |

04- 420

# බඩු බාහිරාදිය විකිණීම්

## පොළොන්නරුව පළාත්බද මහාධිකරණය

මහාධිකරණය වෙත ඉදිරිපත් කර වෙන්දේසියට නියම කරන ලද සහ මෙතෙක් හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01. පොළොන්නරුව පළාත්බද මහාධිකරණය වෙත ඉදිරිපත් කර වෙන්දේසියට නියම කරන ලද සහ මෙතෙක් හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ 2016.04.30 වැනි දින පෙ. ව. 10.00 ට පොළොන්නරුව මහාධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේ නම් වෙන්දේසිය පවත්වන දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර, ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර් වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය එක හමාරකට පෙර වෙන්දේසියට නියමිත භාණ්ඩ මහජනතාවට පරීක්ෂා කර බැලිය හැකි ය.

04. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසු මුදල නොපිළිගැනෙන අවස්ථාවලදී දී අධිකරණයේ අභිමතය පරිදි එම භාණ්ඩ වෙන්දේසියෙන් ඉවත් කර දැමීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා මුදල් ගෙවීමේ දී ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් පමණක් ගෙවීම් සිදු කළ යුතු අතර, චෙක්පත් බැංකු අණකර කිසිවක් භාර ගනු නොලබන අතර භාණ්ඩ මිළදී ගැනීමේ දී තම අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වේ.

06. වෙන්දේසියෙන් මිළ දී ගන්නා ලද භාණ්ඩ වෙන්දේසිය පවත්වන දිනයේ දී ම ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

එච්. පී. ජී. එන්. රණවීර,
මහාධිකරණ විනිසුරු,
පොළොන්නරුව.

2016 මාර්තු මස 14 වැනි දින,
පොළොන්නරුව මහාධිකරණයේ දී ය.

### වෙන්දේසි භාණ්ඩ

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01. | HC/46/14 | කැත්තක් |
| 02. | HC/12/10 | පොරවක් |
| 03. | HC/85/11 | වක් පිහියක්, උදැල්ලක්, පුටු දෙකක් (ප්ලාස්ටික්) |
| 04. | HC/04/13 | ගමන් මල්ලක් |
| 05. | HC/99/06 | උදැල්ලක් |
| 06. | HC/151/06 | උදැල්ලක් |
| 07. | HC/63/14 | වක් පිහියක් |
| 08. | HC/74/06 | වක් පිහියක් |
| 09. | HC/15/09 | වක් පිහියක් |
| 10. | HC/97/10 | පිහියක් |
| 11. | B/113/12 | වක් පිහියක් |
| 12. | HC/77/11 | වක් පිහියක් |
| 13. | HC/86/10 | උදලු එකක් |
| 14. | HC/382/06 | පිහියක්, සවල් දෙකක් |
| 15. | HC/50/14 | වක් පිහියක් |
| 16. | HC/241/06 | කැත්තක් |
| 17. | HC/50/09 | වෑයක් |
| 18. | HC/27/11 | පොරවක් |
| 19. | HC/100/06 | කැත්තක් |
| 20. | HC/09/07 | රූපවාහිනී යන්ත්‍රයක් I අඟල් 21 SV 3962 අංක දරන වර්ණ රූපවාහිනී යන්ත්‍ර එකක් (Serial Number 000205/01) |
| 21. | HC/09/07 | II අඟල් 14 වර්ගයේ වර්ණ රූපවාහිණියක් (Serial Number 462473 සහ දුරස්ථ පාලකයක්) |
| 22. | HC/09/07 | III වර්ණ රූපවාහිණියක් (Serial Number 462637 සහ ඒරියල් එකක්) |
| 23. | HC/122/06 | පා පැදියක් (වර්ගය හා අංක පැහැදිලි නැත) සහ පිහියක් |
| 24. | HC/18/07 | පා පැදියක් (වර්ගය හා අංකය පැහැදිලි නැත) |
| 25. | HC/144/06 | පාපැදියක් (වර්ගය හා අංක පැහැදිලි නැත) |
| 26. | HC/99/14 | AGC වර්ගයේ මොනිටරය |
| 27. | HC/98/14 | CCIVO වර්ගයේ මධ්‍ය සැකසුම් ඒකකය Compac වර්ගයේ යතුරු පුවරුව හා වයර් කෝඩ් එක Canon Pixmaip 2700 Inkjet වර්ගයේ මුද්‍රණ යන්ත්‍රය ලිතෝ වර්ගයේ MOUSE එක |
| 28. | HC/38/09 | පාපැදියක් (වර්ගය හා අංක පැහැදිලි නැත) |
| 29. | HC/183/06 | මිට දිග පිහියක්/යකඩ උකුණු දැත්තක් |
| 30. | HC/40/13 | කැත්තක් |
| 31. | HC/36/11 | වක් පිහියක් |
| 32. | HC/70/06 | කුඩා කැත්තක් |
| 33. | HC/31/06 | අලවංගු දෙකක් සහ පිහියක් |
| 34. | HC/122/06 | කැත්තක් |
| 35. | HC/72/11 | මන්නා පිහියක්. |

04-409

---

## දිසා මහෙස්ත්‍රාත් අධිකරණය - නාවලපිටිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලදුව රාජසන්තක කරනු ලැබූ අංක සොයාගත නොහැකි හා මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. මෙම අධිකරණයේ නඩුවලට අදළ රාජසන්තක කරන ලද, මෙතෙක් හිමිකම් නොකියන ලද භාණ්ඩ නඩු අංක සොයාගත නොහැකි පහත උපලේඛනයේ සඳහන් භාණ්ඩ 2016.05.28 වැනි දින පෙ. ව. 9.00 ට මෙම අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි සඳහන් වන කිසියම් භාණ්ඩයක් පිළිබඳව හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසිය පවත්වන දිනයේ පෙ. ව. 9.30 ට පෙර හිමිකම් තහවුරු කළ යුතුයි.

3. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත වෙන්දේසිය පැවැත්වෙන දින පෙ. ව. 8.00 සිට 9.00 දක්වා වෙන්දේසියේ විකිණීමට සූදනම් කර ඇති ද්‍රව්‍යයන් පරීක්ෂා කර බැලිය හැකි ය.

4. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගන්නා අවස්ථාවේ දී අධිකරණයේ අභිමතය පරිදි එම ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියෙන් මිළ දී ගන්නා භාණ්ඩ එම අවස්ථාවේ මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියලුම ගෙවීම් මුදල්වලින් ගෙවිය යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

6. භාණ්ඩ මිලදී ගන්නා සෑම අයෙකු ම තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිළ දී ගන්නා ලද සියලුම භාණ්ඩ එදින ප. ව. 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

ආර්. එස්. එම්. විජේසේකර,
දිසා විනිසුරු හා මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
නාවලපිටිය.

2016 මාර්තු මස 11 වැනි දින,
නාවලපිටිය දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය | |
|---|---|---|---|
| 1. | අංක රහිත | තඹ දඟර | 26 |
| 2. | අංක රහිත | හෝස්බට කෑලි | 18 |
| 3. | අංක රහිත | නිල්පාට ගෑස් සිලින්ඩර් | 01 |
| 4. | අංක රහිත | කිරි බහාලන භාජන | 02 |
| 5. | අංක රහිත | සිල්වර් පැහැති භාජන | 01 |
| 6. | අංක රහිත | ටයර් | 07 |
| 7. | අංක රහිත | වාහන බැටරි | 03 |
| 8. | අංක රහිත | ගැල්වනයිස් බට | 03 |
| 9. | අංක රහිත | කම්බිකූරු | 20 |
| 10. | අංක රහිත | තහඩු | 23 |
| 11. | අංක රහිත | යකඩ කැබලි තොගයක් (දඟර සහිතව) | |
| 12. | අංක රහිත | කැති | 02 |
| 13. | අංක රහිත | එළවළු කපන පිහියා | 12 |
| 14. | අංක රහිත | පිහියා | 06 |
| 15. | අංක රහිත | මිට නැති දිග පිහියා | 01 |
| 16. | අංක රහිත | පෙති අලවංගු | 03 |
| 17. | අංක රහිත | යකඩ ඉනි (පොඩි) | 03 |
| 18. | අංක රහිත | යකඩ ඉනි (ලොකු) | 02 |
| 19. | අංක රහිත | පොරෝ | 05 |
| 20. | අංක රහිත | උදළු | 01 |
| 21. | අංක රහිත | යකඩ බට | 02 |
| 22. | අංක රහිත | GLOBE වර්ගයේ ඉබ්බෝ | 02 |
| 23. | අංක රහිත | කියත් (තලය රහිත) | 01 |
| 24. | අංක රහිත | මීටර් කෝදු දිග | 02 |
| 25. | අංක රහිත | රතුපාට ගමන් මළු | 01 |
| 26. | අංක රහිත | තැටි තරාදි | 01 |
| 27. | අංක රහිත | මෝටර් ඒකක කැබැල්ලක් | |
| 28. | අංක රහිත | සාරි | 03 |
| 29. | අංක රහිත | කැඩී ගිය වයර් කෝඩ් | 01 |
| 30. | අංක රහිත | බන්ඩි කියත් | 02 |
| 31. | අංක රහිත | සවල් | 01 |
| 32. | අංක රහිත | තාච්චි | 02 |
| 33. | අංක රහිත | කුළු ගෙඩි | 04 |
| 34. | අංක රහිත | කළුපාට යතුරු පැදි | 01 |
| 35. | අංක රහිත | රතුපාට යතුරු පැදි | 01 |
| 36. | අංක රහිත | නිල්පාට යතුරු පැදි (විනාශ වී ඇත) | 01 |
| 37. | අංක රහිත | රතුපාට යතුරු පැදි | 01 |
| 38. | අංක රහිත | නිල්පාට යතුරු පැදි | 01 |
| 39. | අංක රහිත | තීන්ත ආලේප කරන බ්‍රෂ් | 05 |

**සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - හෙල්බොඩ**

| | | | |
|---|---|---|---|
| 1. | අංක රහිත | තෙල් හැඳි | 02 |
| 2. | අංක රහිත | නිල් පාට ගෝස් බට රෝල් | 01 |
| 3. | අංක රහිත | යකඩ බට | 01 |
| 4. | අංක රහිත | උදළු තල | 04 |
| 5. | අංක රහිත | උදළු | 04 |
| 6. | අංක රහිත | කල | 01 |
| 7. | අංක රහිත | බයිසිකල් රෝද | 01 |
| 8. | අංක රහිත | කාපට් | 01 |
| 9. | අංක රහිත | පොඩි පිහි | 05 |
| | අංක රහිත | ලොකු පිහි | 05 |
| 10. | අංක රහිත | කැලණි කේබල් වර්ගයේ වයර් රෝල් | 02 |
| 11. | අංක රහිත | කැති | 02 |
| 12. | අංක රහිත | අලවංගු | 02 |
| 13. | අංක රහිත | වාහන ජැක් | 01 |
| 14. | අංක රහිත | ඉංග්‍රීසි ටයිප් රයිටර් | 01 |
| 15. | අංක රහිත | උදළු තළ | 02 |
| 16. | අංක රහිත | පොරෝ | 06 |
| 17. | අංක රහිත | ලී මිට සහිත මිටි | 02 |
| 18. | අංක රහිත | රේඩියෝ ස්පීකර් | 02 |
| 19. | අංක රහිත | වාහන ලයිට් | 01 |
| 20. | අංක රහිත | සිල්වර් හා වීදුරු භාජන | 03 |
| 21. | අංක රහිත | මුල්ලු | 01 |
| 22. | අංක රහිත | කියත් | 01 |
| 23. | අංක රහිත | සවල් | 02 |

| | | |
|---|---|---|
| 1. | 74786 | Add වර්ගයේ ඉලෙක්ට්‍රොනික් තරාදිය |
| 2. | 72261 | 10kg දුනු තරාදිය |
| 3. | 74782 | 15 kg Budry WP 15 වර්ගයේ ඉලෙක්ට්‍රොනික් තරාදිය |
| 4. | 72262 | 15 kg රයිඩර් වර්ගයේ ඉලෙක්ට්‍රොනික් තරාදිය |
| 5. | 72490 | සිංගර් වර්ගයේ බෙහෙත් විදින මැෂින් 02 |
| 6. | 75632 | Margoun වර්ගයේ චාජර් 01යි |
| 7. | 75636 | 3 G Power වර්ගයේ චාජර් 01යි |
| 8. | ඒ. ආර්. 1944/15 | ගොල්ෆ් ක්‍රීඩා කට්ටලය<br>ගෝල්ෆ් බෝල 08යි<br>ගෝල්ෆ් මිටි 08යි<br>හම් මිටි 01යි, ගලව්ස් 01යි |

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ පිළිබඳ විස්තරය |
|---|---|---|
| 9. | 74785 | තරාදි 01යි |
| 10. | 71101 | සවල් 01යි |
| | | යකඩ බාල්දි 01යි |
| 11. | 75358 | තාච්චි 01 යි, උදලු 01යි |
| 12. | 54039 | සෙල්ලම් බඩු බෑගය (නඩු පොත විනාශ කර ඇත) |
| 13. | බී 88/05 | පිහියා 01යි |
| 14. | 72022 | අලවංගු 01යි |
| | | ප්ලාස්ටික් තාච්චි 01 |
| 15. | 68346 | සවල් 01 |
| 16. | 75747 | ළමා ඇඳුම් 03 |
| 17. | 75744 | ළමා සෙරෙප්පු ජෝඩු 02 |
| 18. | 75745 | භාණ්ඩ පිරිසිදු කරන දඟරය |

**සංචාරක මහෙස්ත්‍රාත් අධිකරණය - හෙල්බොඩ**

| | | |
|---|---|---|
| 1. | 28407 | සවල් 01 |
| 2. | 29679 | වාහන ජැක් 01යි යතුරු 10 |
| 3. | 29128 | සවල් 01යි |

04-434

# රජයේ නොවන දැන්වීම්

### සීමාසහිත සමාගමක් සංස්ථාගත කිරීමේ මහජන නිවේදනය

2007 අංක 07 දරන සමාගම් පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව මෙහි පළකරනු ලබන නිවේදනය.

සමාගමේ නම : ශාන්ති මෙඩිකල් කෙයාර් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 112237, 2016.03.04
සමාගමේ ලියාපදිංචි කාර්යාල ලිපිනය : අංක 312, හැදල පාර, වත්තල.

04-408

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකාවේ, හෝමාගම, කැන්දලන්ද, අංක 146 දරන ස්ථානයෙහි පදිංචි තෙන්නකෝන් මුදියන්සේලාගේ නාමල් තෙන්නකෝන් (ජා. හැ. අංක 616191217 V) වන මා විසින් හෝමාගම, කැන්දලන්ද, අංක 146 දරන ස්ථානයෙහි පදිංචි අමරසිංහ අච්චිගේ නන්දරත්න යන අය වෙත ප්‍රදානය කරන ලද හෝමාගම ප්‍රසිද්ධ නොතාරිස්, ඒ. එම්. ඩබ්ලිව්. ජයතිලක මහතා විසින් සහතික කරන ලද අංක 5619 සහ 2013 අගෝස්තු 28 වැනි දින දරන ඇටර්නි බලපත්‍රය 2016.03.18 වැනි දින සිට වහාම බලපැවැත්වෙන පරිදි මෙයින් ප්‍රත්‍යාදිෂ්ඨ කොට අවලංගු කරනු ලබන බවත්, එකී අමරසිංහ අච්චිගේ නන්දරත්න යන අය විසින් එකී ඇටර්නි බලපත්‍රය මත මින් ඉදිරියට කරනු ලබන කිසිදු ක්‍රියාවකට මා වගකියනු නොලබන බවටත්, ඒ හා සම්බන්ධ කිසිදු වගකීමකට මා නොබැඳෙන බවටත් ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දැනුම් දෙනු ලැබේ.

තෙන්නකෝන් මුදියන්සේලාගේ
නාමල් තෙන්නකෝන්.

04-411

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) (8) දරන වගන්තිය යටතේ සමාගමේ නම වෙනස් කිරීම.

සමාගමේ කලින් නම : ඇක්සෙන්චර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : P V 104096
සමාගමේ ලිපිනය : අංක 46/2/1, තිඹිරිගස්යාය, හැදල පාර, වත්තල.
සමාගමේ අලුත් නම : එක්ස්කිව්සිටෙක්ස් හෝල්ඩින්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.

ලේකම්වරු.

04-415

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ජේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : වොට්සන් මෙඩිකල්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : P V 109336
සංස්ථාගත කළ දිනය : 2015.10.23
ලිපිනය : අංක 688, අළුත්මාවත පාර, කොළඹ 15.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

04-416

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : බී ආර් වෝල්කර් වෙබර් හෝල්ඩිං (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111256
සංස්ථාගත කළ දිනය : 2016.02.08
ලිපිනය : 10 වැනි පටුමග, ඉරනවිල, අඹකන්දවිල, හලාවත.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

04-417

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන ඡේදය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : එස් පී ජී පී හෝල්ඩිංස් ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111939
සංස්ථාගත කළ දිනය : 2016.02.18
ලිපිනය : අංක 233/2, හෙයියන්තුඩුව, මාබිම, බියගම - 11618
ශ්‍රී ලංකා.

කොම්සෙකි (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

04-418

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) කොටසට අනුකූලව ශ්‍රී වටානියා ෆාම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම 2015 මැයි මස 18 වැනි දින සංස්ථාපනය කරන ලද බව මෙයින් දන්වනු ලැබේ.

සමාගමේ නම : ශ්‍රී වටානියා ෆාම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 105673
ලියාපදිංචි කළ දිනය : 2015.05.18
ලියාපදිංචි කාර්යාලය : අංක 49, පීරිස් පාර, ගල්කිස්ස.

ශ්‍රී වටානියා ෆාම්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

04-424

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

බොරලැස්ගමුව, කටුවාවල, ආසිරි උයන, අංක 12 ඒ සහ කොළඹ 12, නීතිඥ කාර්යාල සංකීර්ණය, අංක 34/1/59 හි පදිංචි 658154109 වී දරන ජාතික හැඳුනුම්පත හිමි සීක්කුගේ සන්ධ්‍යා චන්ද්‍රිකා ද සිල්වා වන මා වෙත,

එංගලන්තය, ඩෝර්සෙට්, බර්න්මවුත්, සවුත්බර්න්, ස්ටෝර්ලීෆ් ඇවනිව් අංක 26 දැනට එංගලන්තය, W1H 1RP, 26 අපර් මොන්ටගු, ෆ්ලැට් 4 දරන ස්ථානයේ පදිංචි ශිරාණි ලැවිනියා ඈන් ද මෙල් යන අය විසින්, ඇයගේ ඇටෝර්නි බලකාරිය වශයෙන් කටයුතු කිරීමට 2005.12.10 දිනැති විදේශ ඇටෝර්නි බලපත්‍රය මගින් බලය පවරා ඇත.

එකී 2015.12.10 දිනැති විදේශ ඇටෝර්නි බලපත්‍රය ප්‍රකාරව මා වෙත පවරන ලද බලතල අනුව, එකී ශිරාණි ලැවිනියා ඈන් ද මෙල් යන අය විසින් 2006.11.08 දිනැති විදේශ ඇටෝර්නි බලපත්‍රය මගින් කොළඹ 07, බුලර්ස් පාර, අංක 410/108 දරන ස්ථානයෙ හි පදිංචි හරිත විජිත් හෙන්රි වීරසිංහ යන අයට එකී ශිරාණි ලැවිනියා ඈන් ද මෙල් යන යන වෙනුවෙන් කටයුතු කිරීමට පවරා දුන් ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මෙයින් දනුම්දෙමි.

ශිරාණි ලැවිනියා ඈන් ද මෙල් ගේ,
ඇටෝර්නි බලකාරිය වන සීක්කුගේ
සන්ධ්‍යා චන්ද්‍රිකා ද සිල්වා මගින්.

2016 මාර්තු මස 16 වැනි දින.

04-426

---

### දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) දරන වගන්තිය යටතේ නිවේදනයයි.

සමාගමේ නම : ද යාල හොලිඩේස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 73263
ලියාපදිංචි කාර්යාලය : කේ ජී - 5, ඩයස් මාවත, ගුණසිංහපුර, කොළඹ 12
ලියාපදිංචි කල දිනය : 2010.07.16

සමාගමේ ලේකම්වරු.

04-437

---

### ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පන්නිපිටිය, දෙපානම, අංක 94 දරන ස්ථානයේ පදිංචි රොබෙටා කාන්ති තිසේරා වන මා විසින් 2015.11.23 වැනි දින කොට්ටාව හි දී අත්සන් කරන්නට යෙදුණු අංක 3777 දරන ඇටෝර්නි බලපත්‍රය මගින් කොළඹ 13, සංඝමිත්තා මාවත, අංක 39/1 දරන ස්ථානයේ පදිංචි මොහොමඩ් ලතිෆ් මොහොමඩ් රියාස් යන අයට පවරන ලද සියලුම ඇටෝර්නි බලතල 2016.03.21 වැනි දින සිට අවලංගු කරනු ලබන බව සියලු දෙනා වෙතම මෙයින් දන්වා සිටිමි.

රොබෙටා කාන්ති තිසේරා.

2016 මාර්තු මස 21 වැනි දින.

04-440

## සීබෝල්ඩ් සොක්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 07 දරන සමාගම් පනතේ 334 වැනි වගන්තිය ප්‍රකාරව සිදු කරන නිවේදනයයි.

සමාගමේ ණයහිමියන්ගේ රැස්වීමක් 2016 අප්‍රේල් මස 22 වැනි දින පෙ. ව. 11.30 ට කොළඹ 3, ගාලු පාරේ, අංක 142 දරන යතමා ගොඩනැගිල්ලේ, 3 වන මහලේ, නානායක්කාර සහ සමාගමේ කාර්යාලයන්හි දී පැවැත්වෙන බව 2007 අංක 7 දරන සමාගම් පනතේ 334 වැනි වගන්තිය ප්‍රකාරව මෙයින් නිවේදනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

කෝපරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
ලේකම්වරු.

2016 මාර්තු මස 21 වැනි දින.

04-442

---

## දැන්වීමයි

2007 අංක 07 දරන නව සමාගම් පනතේ 9 (1) වගන්තියේ විධිවිධාන යටතේ පහත විස්තර දැක්වෙන ආයතනය සීමාසහිත සමාගමක් ලෙස ලියාපදිංචි කරන ලදී.

සමාගමේ නම : සී එන් මැක්ස් ක්‍රියේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී. වී. 112224
ලියාපදිංචි දිනය : 2016.03.03
ලියාපදිංචි ලිපිනය : අංක 20/5, කටුවාන පාර, හෝමාගම.

සමාගම් ලේකම්.

04-445

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

ගෝනවල, පමුණුවිල, අංක 39/14 පදිංචි වර්ණකුලසූරිය චන්ද්‍රවතී තිසේරා වන මා විසින් ගෝනවල, පමුණුවිල අංක 39/14 පදිංචි වර්ණකුලසූරිය ෂාමිලා අරුණි තිසේරා වෙත ප්‍රදානය කළ කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් කාන්ති මුණගමආරච්චි විසින් සහතික කළ අංක 5017 සහ 2015.09.06 දිනැති ඇටෝර්නි බලපත්‍රය 2016.12.15 දින සිට අවලංගු හා අහෝසි වන අතර, එය බලපැවැත්වීමක් නොවන බව ශ්‍රී ලංකා ජනරජය වෙත සහ මහජනතාව වෙත මෙයින් දන්වා සිටිමි.

වර්ණකුලසූරිය චන්ද්‍රවතී තිසේරා.

2016 පෙබරවාරි මස 20 වැනි දින.

04-448

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 34 වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීමයි

වර්ෂ 2016.03.15 වැනි දින මැනුෆැක්චරිං ඇන්ඩ් ඉංජිනියරින් සර්විසස් ඉන්ඩස්ට්‍රිස්කිල්ස් කවුන්සිල් නමින් ඇපයෙන් සීමිත සමාගමක් රාජගිරිය, වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 971 හි සංස්ථාගත කර ඇති බවත් එකී සමාගමේ ලියාපදිංචි අංකය ජී ඒ 3157 බවත් ශ්‍රී ලංකා වාසි ජනතාව වෙත මෙයින් දැනුම්දෙනු ලැබේ.

ත්‍රී එම් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-458

---

## 2007 අංක 7 දරන සමාගම් පනතේ අංක 34 වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීමයි

වර්ෂ 2016.03.10 වැනි දින ඉන්ෆොමේෂන් ඇන්ඩ් කමියුනිකේෂන් ටෙක්නොලොජි ඉන්ඩස්ට්‍රි ස්කිල්ස් කවුන්සිල් නමින් ඇපයෙන් සීමිත සමාගමක් රාජගිරිය වැලිකඩ, ශ්‍රී ජයවර්ධනපුර මාවත, අංක 971 හි සංස්ථාගත කර ඇති බවත්, එකී සමාගමේ ලියාපදිංචි අංකය ජී ඒ 3154 බවත් ශ්‍රී ලංකා වාසි ජනතාව වෙත මෙයින් දැනුම්දෙනු ලැබේ.

ත්‍රී එම් ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-459

---

## සමාගමේ නම වෙනස් කිරීම ජනතාව වෙත දැනුම්දීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ පහත සඳහන් සීමාසහිත පුද්ගලික සමාගමේ නම 2016 මාර්තු මස 10 වැනි දින වෙනස් කළ බව මෙයින් දන්වා සිටිනු ලැබේ.

සමාගමෙ පෙර නම : හම්බන්තොට ෂිප් චැන්ඩ්ලර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 79492
ලියාපදිංචි කාර්යාලය : 100, කින්සි පාර, කොළඹ 7
සමාගමේ නව නම : ඉන්දොල සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්

එස්ජේ කෝර්පරේට් සර්විසස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්.

03 වැනි මහල, අංක 11,
කාසල් පටුමග, කොළඹ 04.

04-460

## දැන්වීමයි

2007 සමාගම් පනතේ අංක 7 අනුව, පහත සඳහන් සමාගම සංස්ථාගත කිරීම පිළිබඳව මේ මගින් දැනුම් දෙනු ලැබේ.

සමාගමේ නම : ලෙක්ස් ෆාමා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්
පී වී 109473
ලියාපදිංචි ලිපිනය : අංක 104, 1/3, පාගොඩ පාර, පිටකෝට්ටේ, නුගේගොඩ.
සංස්ථාගත කළ ලිපිනය : 2015.11.23

ලේකම්.

04-462

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය අනුව පහත සඳහන් සමාගම සංස්ථාපනය කළ බවට කරනු ලබන නිවේදනයයි.

සමාගමේ නම : විජය ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 111956
ලියාපදිංචි ලිපිනය : අංක 606, මාකොළ උතුර, මාකොළ
සංස්ථාගත කළ දිනය : 2016 පෙබරවාරි මස 18 වැනි දින.

සමාගම් අධ්‍යක්ෂ.

04-473

---

## නිවේදනයයි

පහත සඳහන් සමාගම සංස්ථාපනය කර ඇති බව 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ මෙයින් නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : පර්ෆෙක්ට් ලැන්ඩ්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : පී වී 112464
ලියාපදිංචි ලිපිනය : අංක 322/1, දික්වැල්ල පාර, සියඹලාපෙ උතුර
සංස්ථාපනය කිරීමේ දිනය : 2016 මාර්තු 16

සමාගම් අධ්‍යක්ෂ.

04-474

---

## ඇටෝර්නි බලය අවලංගු කිරීම

අංක 25, පැඟිරිවත්ත මාවත, මිරිහාන නුගේගොඩ පදිංචි ගම්මනගේ විමලාවතී පෙරේරා හේවාවිතාරණ වන මා විසින් අංක 12/200 පළමු පටුමග එගොඩවත්ත පාර, බොරලැස්ගමුව පදිංචි ගම්මනගේ කමලාවතී පෙරේරා සමරවීර හෙට්ටි වෙත පවරා දෙන ලද කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. හේවාවිතාරණ විසින් ලියා සහතික කරන ලද අංක 03 දරන 2015.05.28 දිනැති ඇටෝර්නි බලය ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරනු ලැබේ.

ගම්මනගේ විමලාවතී පෙරේරා හේවාවිතාරණ.

04-487

---

## මහජන දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනත 9 (1) වගන්තිය ප්‍රකාරව මිලේනියම් සෝසිං සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් (පෞද්ගලික) සීමිත වගකීම් සමාගමක් ලෙස 2014 ඔක්තෝබර් මස 23 වැනි දින සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : මිලේනියම් සෝසිං සොලුෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පී වී 101 661
ලියාපදිංචි ලිපිනය : ඒ 6/1/2, මැනින් ටවුන් හවුසින් ස්කීම්, මංගල පාර, කොළඹ 08.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ජී. ඒ. කන්සල්ටන්ට්ස් (පුද්ගලික) සමාගම,
ලේකම්වරු.

දුරකථන අංක : 071 8244495, 077 8197041, 011 2837668.

04-488

---

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව දැනුම් දෙනු ලැබේ.

සමාගමේ පූර්ව නාමය : කෙයාර් ලොජිස්ටික්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ ලියාපදිංචි අංකය : පී වී 2991
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 31, ශාන්ත කිල්ඩාස් පටුමග, කොළඹ 03
සමාගමේ නව නාමය : කෙයාර් ලොජිස්ටික් (ප්‍රයිවට්) ලිමිටඩ්
පූර්ව නාමය වෙනස් වූ දිනය : 2016 මාර්තු මස 18 වැනි දින.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ෆයිනෑන්ෂියල් ඇන්ඩ් බිස්නස්
ඇසෝසියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්,
සමාගම් ලේකම්වරු.

04-489

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

ශ්‍රී ලංකා ප්‍රජතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගනේමුල්ල, කඩවත පාර, අංක 199/4 හි පදිංචි මල්ලුව වඩුගේ සුනිල් ගාමිණී වන මම ප්‍රසිද්ධ නොතාරිස් පී. ඩී. ආර්. චන්ද්‍රිකා බණ්ඩාරනායක මහත්මිය විසින් ලියා සහතික කළ අංක 3393 සහ 2014.03.01 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් මාගේ ඇටෝර්නි බලකාරිය ලෙස මල්ලුව වඩුගේ නිල්මිණී ප්‍රියදර්ශනී යන අය පත් කළ අතර අද පටන් එය අවලංගු කරන බවත් අද පටන් එකී ඇටෝර්නි බලකාරිය විසින් කරන ලද කිසියම් හෝ කරුණකට මා වග නොකියන බවත් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

04-511

### ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

නල්ලදරන් කට්ටුව බෝගමුව වත්ත අංක 302/ඒ පදිංචි චන්ද්‍රසේකර මුදියාන්සේලාගේ සුරංගනි ලක්මාලි වන මා විසින් මෙරෙඤ්ඤගේ ලක්සිරි ප්‍රනාන්දු වෙත, ටී. ජේ. එම්. සොනාලි ප්‍රනාන්දු ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2015.11.10 වැනි දින ලියා සහතික කළ අංක 781 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍ර පොතේ 175 කාණ්ඩයේ 18 වැනි පත් ඉරුවේ 445 දරන දින පොතේ අංක යටතේ ලියාපදිංචි කර ඇති විශේෂ ඇටෝර්නි බලපත්‍රය බල රහිත කර අවලංගු කරන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රවාදී සමාජවාදී ජන රජය යටතේ පොදු මහජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

04 - 521

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

### ප්‍රසිද්ධ වෙන්දේසියක්

ගම්පහ, මුදුන්ගොඩ ප්‍රාදේශීය සභා සීමාවේ ඉහළ යාගොඩ, පිහිටා ඇති රාජසිංහම් ඉන්ඩස්ට්‍රීස් ලිමිටඩ් ආයතනය සතු අංක 1842 දරන පිඹුරේ නිරූපිත කැබලි අංක 7, 4 දරන බිම් කැබලි අංක 230 දරන පිඹුරේ නිරූපිත බී දරන බිම් කැබැල්ල හා අංක 61 දරන පිඹුරේ නිරූපිත නිශ්චිත මුළු බිම් කැබැල්ල දරන බිම් කැබලි 4ක්

(1) බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ මැද පත්තුවේ ''ඉහළ යාගොඩ ග්‍රාමයෙහි පිහිටා ඇත්තා වූ ද, උතුරට : අංක 8 බිම් කැබැල්ලෙන්'' නැගෙනහිරට : අංක 14 හා 6 බිම් කැබලිවලින් දකුණට: එස් ජයකොඩිට අයත් ඉඩමෙන් හා බස්නාහිරට : අංක 11 බිම් කැබැල්ලෙන් මායිම් වූ ද, අංක 1842 දරන එකී පිඹුර ප්‍රකාර පර්චස් දහ අටයි දශම හයකින් යුක්ත වූ ද, (අ. 0 රූ. 0 පර්. 18.6) ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 486/38 හිමිකම් යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, ''යාගොඩ එස්ටේට්'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ මහතා විසින් සාදන ලද අංක 1842 හා 1985 මාර්තු මස 20 වැනි දින පිඹුරේ නිරූපිත අංක 7 බිම් කැබැල්ල වශයෙන් සළකුණු කොට ඇති බෙද වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල වේ.

(2) ඉහත කී ඉහළ යාගොඩ ග්‍රාමයෙහි පිහිටා ඇත්තා වූ ද, උතුරට : අංක 3 බිම් කැබැල්ලෙන් නැගෙනහිරට : ගම්පහ දිසා අධිකරණයේ අංක 22404/පී දරන බෙදුම් නඩුවේ ඉදිරිපත් කර ඇති බලයලත් මිනින්දෝරු ඩබ්ලිව්. ජේ. ද සිල්වා මහතා විසින් සාදන ලද අංක 1222 හා 1983 පෙබරවාරි මස 23 වැනි දින දරන පිඹුරේ ''බී'' කැබැල්ලෙන් වශයෙන් සළකුණු කොට ඇති ඉඩමේ කොටසකින් දකුණට : අංක 5 බිම් කැබැල්ලෙන් හා බස්නාහිරට : අංක 14 බිම් කැබැල්ලෙන් (අඩි 15ක් පළල ඇති පාරක් සඳහා වෙන් කර ඇති භූමියෙන්) මායිම් වූ ද, අංක 1842 දරන එකී පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් පර්චස් පහළොවයි දශම දෙකයි බින්දුවකින් (අ. 0 රූ. 0 පර්. 15.20) යුක්ත වූ ද ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 303/179 හිමිකම් යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, ''යාගොඩ එස්ටේට්'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ මහතා විසින් සාදන ලද අංක 1842 හා 1985 මාර්තු මස 20 වැනි දින පිඹුරේ නිරූපිත අංක 4 බිම් කැබැල්ල වශයෙන් සළකුණු කොට ඇති බෙද වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල වේ.

(3) ඉහත කී ඉහළ යාගොඩ ග්‍රාමයෙහි පිහිටා ඇත්තා වූ ද, උතුරින් ප්‍රධාන පාරෙන්, නැගෙනහිරින් එම ඉඩමේ ම ''බී'' බිම් කැබැල්ලෙන් දකුණින් එම ඉඩමේ ම ''සී'' බිම් කැබැල්ලෙන් හා අංක 4 බිම් කැබැල්ලෙන් හා බස්නාහිරින් ''ඒ'' සහ ''සී'' බිම් කැබලිවලින් මායිම් වූ ද, අංක 230/1992 දරන පිඹුර ප්‍රකාරව ප්‍රමාණයෙන් පර්චස් විසි එකයි දශම එකයි පහකින් (අ. 0 රූ. 0 පර්. 21.15) යුක්ත වූ ද, ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 402/184 හිමිකම් යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, ''යාගොඩ එස්ටේට්'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු කේ. ඒ. රූපසිංහ මහතා විසින් සාදන ලද අංක 230/1992 හා 1992 අප්‍රේල් 24 වැනි දින පිඹුරේ නිරූපිත ''බී'' බිම් කැබැල්ල වශයෙන් සළකුණු කොට ඇති බෙද වෙන් කරන ලද හා නිශ්චිත මුලු ඉඩම් කැබැල්ල වේ.

(4) ඉහත කී ඉහළ යාගොඩ ග්‍රාමයෙහි පිහිටා ඇත්තා වූ ද, උතුරින් බී. ඒ. කුසුමානන්දට අයිති ඉඩමෙන්, පාරෙන් හා අංක 1842 දරන පිඹුරේ අංක 3 බිම් කැබැල්ල වශයෙන් සලකුණු කොට ඇති ඩබ්ලිව්. ඒ. සිරිසේනට අයත් ඉඩමෙන්, නැගෙනහිරට ඩබ්ලිව්. ඒ. සිරිසේනට අයිති ඉඩමෙන් (අංක 1842 දරන පිඹුරේ අංක 5 බිම් කැබැල්ල) හා ඩබ්ලිව්. එම්. රාජසිංහට අයත් ඉඩමෙන් දකුණින් ඩබ්ලිව්. එම්. රාජසිංහට අයිති ඉඩමෙන් හා එම්. එස්. මීගොඩට අයිති ඉඩමෙන් හා බස්නාහිරට : එම්. එස්. මීගොඩට අයිති ඉඩමෙන් මායිම් වන්නා වූ ද, අංක 61 දරන එකී පිඹුර ප්‍රකාර ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් දශම දෙකකින් (අ. 0 රූ. 1 පර්. 0.2) යුක්ත වූ ද ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ඊ 532/235 හිමිකම් යටතේ ලියාපදිංචි කර ඇත්තා වූ ද, ''යාගොඩ වත්ත'' යනුවෙන් හඳුන්වනු ලබන ඉඩමෙන් බලයලත් මිනින්දෝරු ඒ. ඒ. පී. ඒ. රංජිත් මහතා විසින් සාදන ලද අංක 61 හා 1996 ඔක්තෝබර් මස 28 වැනි දින පිඹුරේ නිරූපිත බෙද වෙන් කරන ලද හා නිශ්චිත මුළු ඉඩම් කැබැල්ල හා ඒ මත පිහිටා ඇති ගොඩනැගිලි ද සමග වේ.

එකී 1 වන 2 වන සහ 4 වන ඉඩම් කැබලිවලට බලයලත් මිනින්දෝරු එස්. වික්‍රමසිංහ මහතා විසින් සාදන ලද අංක 1842 හා 1985 මාර්තු මස 20 වැනි දින දරන පිඹුරේ නිරූපිත අංක 14 දරන බිම් කැබැල්ල වශයෙන් සළකුණු කොට ඇති පාරක් සඳහා වෙන්කරන ලද භූමිය මතු පිටින් මාර්ග අයිතිය ද සමග වේ.

(අ) පළමුවන නඩු නිමිත්ත මත රු. 30,700,000 ක මුදලක් සහ 2006 අගෝස්තු මස 16 දින තෙක් උපචන පොළිය වශයෙන් රු. 44,017,223.50 ක මුදලක් හා රු. 30,700,000.00 ක් වූ මුදලක් මත 2006 අගෝස්තු මස 17 වැනි දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් වර්ෂයකට 30% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් ද, සමඟ සහ (ආ) දෙවන නඩු නිමිත්ත මත රු. 13,000,000.00 සහ 2006 අගෝස්තු මස 16 වැනි දින තෙක් උපචන පොළිය වශයෙන් රු. 18,639,215.16 ක මුදලක් හා රු. 13,000,000.00 ක් වූ මුදලක් මත 2006 අගෝස්තු මස 17 වැනි දින සිට ඒ මුදල සම්පූර්ණයෙන් ගෙවා අවසන් කරනු ලබන තෙක් වර්ෂයකට 30% ක අනුප්‍රමාණයක් අනුව වූ පොළියක් ද, නඩු ගාස්තු සහ වෙන්දේසිකරුගේ ගාස්තු ද අයකර ගැනීම පිණිස (1) රාජසිංහම් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ් අංක 105, මැසෙන්ජර් වීදිය, කොළඹ 12, සහ අංක 247, ගාලු පාර, කොළඹ 04 සහ අංක 190 සී, ඉහළ යාගොඩ, ගම්පහ. (2) මුත්තයියා විලියම්ස් රාජසිංහම්, මුත්තයියා විලියම් රාජසිංහම් යනුවෙන් ද හඳුන්වනු ලැබේ. (3) ජෝර්ඩන් රාජකුමාර් රාජසිංහම් (4) ආරුනන්

නිරංජන් රාජසිංහම් (5) දිපන් ප්‍රේමකුමාර් රාජසිංහම් සියලු දෙනාම අංක 63, ඩේවිඩ්සන් පාර, කොළඹ 04 සහ අංක 190 සී, ඉහළයාගොඩ, ගම්පහ යන අයට විරුද්ධව කොළඹ 01 අංක 21 බ්‍රිස්ටල් වීදියේ හි පිහිටා ඇති ''කොමර්ෂල් හවුස්'' සහ කොළඹ 12 පරණ යෝන් වීදියේ අංක 442/ඒ දරන ස්ථානයේ එහි ශාඛා කාර්යාලයක් පිහිටා ඇති කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් ලිමිටඩ් විසින් කොළඹ දී පැවැත්වෙන බස්නාහිර පළාතේ පළාත් (සිවිල්) මහාධිකරණයේ නඩු අංක 302/2007 එම්. ආර්. දරන නඩුවෙන් මා වෙත පවරා ඇති බලය මත ඉහත කී දේපළ මා විසින් 2016 ක් වූ මැයි මස 06 වැනි දින පිළිවෙලින් පෙරවරු 11.00 ට, 11.15, 11.30 ට සහ 11.45 ට අදළ දේපළ පිහිටි ස්ථානයන් හි දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට ප්‍රවිශ්ඨවන මාර්ගය* .- කොළඹ සිට මහනුවර දක්වා දිවෙන මාර්ගය ඔස්සේ ඉඹුල්ගොඩ මංසන්දිය දක්වා කි. මී. 24 කණුව දක්වා ගමන් කොට වමට හැරී ඉඹුල්ගොඩ ගම්පහ මාර්ගයේ කි. මී. 1.5ක් පමණ ගමන් කිරීමෙන් මෙම මාර්ගයේ වම් පසින් මෙම දේපළ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.* - වෙන්දේසිය අවසානයේ දී සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් මුදල් ඒ අවස්ථාවේ ම වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. (1) ගැණුම් මිලෙන් 25%ක් ද, (2) පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ක් ද, (3) වෙන්දේසිකරුගේ වෘත්තිය ගාස්තු වශයෙන් 2.5%ක් ද, (4) වෙන්දේසිය සඳහා දරන්නට වූ සියලුම වියදම් ද, (5) සෝෂක හා ලිපිකරු ගාස්තු වශයෙන් රු. 2,500 ක මුදලක් ද, (6) වෙන්දේසි කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු වශයෙන් එක් ඔප්පුවක් සඳහා රු. 7,500 බැගින් මුදලක් ද, වන අතර ගැණුම් මිලේ පරිශේෂය වන 75% ක මුදල වෙන්දේසි දිනයේ සිට දින 30ක් ඇතුළත ගරු අධිකරණයේ මෙම නඩුවේ බැරට තැන්පත් කළ යුතු ය.

වැඩිදුර විස්තර සඳහා කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 41 දරන ස්ථානයේ නීතිඥවරුන් හා නොතාරිස්වරුන් වන ජුලියස් ඇන්ඩ් ක්‍රිසි සමාගමෙන් විමසන්න. දුරකථන අංක 011- 2422601 දිගුව 408.

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
වරලත් වෙන්දේසිකරු.

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011-28736565, 0777 672082 ෆැක්ස් අංකය : 011-2871184.

04-446

---

**පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වන වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ වර්ෂ 2016 ක් වූ අප්‍රේල් මස 28 වන දින පෙ.ව. 10.30 ට දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, සල්පිටි කෝරළේ, පල්ලේ පත්තුවේ, (දෙල්කඳ ලියාපදිංචි කොට්ඨාසය තුල) ශ්‍රී ජයවර්ධනපුර මහ නගර සභා සීමාව තුල, ශ්‍රී ජයවර්ධනපුර ප්‍රාදේශීය ලේකම් කාර්යාලය තුල 520ඒ කොස්වත්ත ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, නාවල කොස්වත්ත පාර පළවන පටුමග පිහිටි වරිපනම් අංක 81/3 ඒ දරන, බලයලත් මිනින්දෝරු එම්. එල්. එන්. පෙරේරා විසින් මැන සාදන ලද 23.06.2009 දිනැති අංක 5257 දරන පිඹුරෙහි ලොට් ඒ 1 වශයෙන් නිරූපිත ''නාවල කුරුඳුවත්ත'' නැමති ඉඩම.

පිඹුරු අංක 2135 හි ලොට් අංක 4 මගින් මාර්ග අයිතිය ද සමග වේ. (විශාලත්වය : අ. 0, රූ. 0, පර්. 10.37) කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් ආර්. ආර් එල්. සී. රණසිංහ විසින් සහතික කරන ලද වර්ෂ 2013 ක්වූ ඔක්තෝබර් මස 08 වන දිනැති අංක 419 උකස්කරය මතලැබිය යුතු මුදල් ගෙවීම සිදු කිරීම, ඔෂීමාර් ඉන්ජිනියරින් ප්‍රයිවට් ලිමිටඩ් බන්ධනදායී/උකස්කරු ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද, යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2016.03.18 දින දරන *ගැසට් පත* සහ ඩේයිලි නිවුස්, ලක්බිම, සුඩර් ඔලි පුවත් පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* .- නාවල පාරේ වැලිකඩ - රාජගිරිය දෙසට මීටර් 900 ක් යන විට කොස්වත්ත හන්දිය හමුවේ. එහි සිට වමට හැරී කොස්වත්ත පාරේ මීටර් 100 ක් පමණ යන විට වම් අත පැත්තේ 1 වන පටුමග පිහිටා ඇත. එම පටුමගේ නැවත මීටර් 100 ක් පමණ යන විට "T" මංසන්ධිය හමුවේ. එතැනින් වමට හැරී නැවත මීටර් 150 ක් යන විට වම් අත පැත්තේ විෂය ගත දේපල පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් වියදම් මුදල්වලින් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැනුම් මිලෙන් 10% ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක්ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක් ද (සියයට දෙකහමාරක්)
4. විකිණීමේ සම්පූර්ණ ගාස්තුව හා අනෙකුත් ගාස්තු ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3,000)

වෙන්දේසි දිනයේ සිට දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ක ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ හිමිකම් ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු සඳහා කළමණාකරු - ණය අය කර ගැනීම් අංශය පැන් ඒෂියා බැංකින් කෝපරේෂන් පීඑල්සී ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර කොළඹ 03. දුරකථන : 011-4667227/011-2565573

පී. කේ. ඊ. සේනාපති,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු,

අංක 134, බැද්දගාන පාර,
කෝට්ටේ.
දුරකථන අංක : 011-2873656, 0777-672082 ෆැක්ස් : 011-2871184

04-493

**පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පී. එල්. සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

බැංකුවෙන් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දක්වෙන දේපළ පහත දක්වෙන දිනයේ දී එකී දේපළ පිහිටි ස්ථානයේ දී එහි දක්වා ඇති වේලාවේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

දකුණු පළාතේ, (ගාල්ල ලියාපදිංචි කිරීමේ කොට්ඨාසය ඇතුළත) ගාල්ල දිස්ත්‍රික්කයේ, තල්පේ පත්තුවේ, අක්මීමණ ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රාදේශීය සභා කොට්ඨාසය ඇතුළත, යටගම ග්‍රාම නිලධාරි කොට්ඨාස අංක 133 බී, කොට්ඨාසය ඇතුළත යටගම ග්‍රාමයෙහි ''සුසීමා එස්ටේට්'' නමැති ඉඩම බලබලත් මානක ටී. ජී. උපසේන විසින් සකසන ලද 2013 මැයි 08 දිනැති පිඹුරු අංක 1178ඒ හි ලොට් ඒ වශයෙන් දක්වා ඇති (බලයලත් මානක කේ. ජී. ජේ. ද සිල්වා විසින් සකසන ලද 2003.09.06 දිනැති අංක 44/2003 දරන පිඹුරෙහි ලොට් ඩීඒ සහ බලයලත් මානක ටී. ජී. උපසේන විසින් සකසන ලද 2010.11.26 දිනැති අංක 914 දරන පිඹුරෙහි ලොට් 3 වශයෙන් දක්වා ඇති බෙද වෙන් කළ යාබද කොටසෙහි නැවත මිනීමක් සහ අතුරු බෙදීමක් වන) ඉඩම් කැබැල්ල වේ.

(බිම් ප්‍රමාණය අ. 2 රූ. 3 පර්. 0)
වර්ෂ 2016 ක් වූ අප්‍රේල් මස 25 වැනි දින පෙ. ව. 11.30 ට

දේපළට පිවිසෙන මාර්ගය. - ගාල්ල නගරයේ සිට මාතර පාර දිගේ උණවටුනේ, එරමඳුගහ හන්දිය දක්වා කි. මී. 6 ක පමණ දුරක් ගමන් කර වමට හැරී හීනටිගල පාරේ කි. මී. 1/2ක් පමණ ගමන් කරන්න. ඉන්පසු වමට හැරී අක්කරගොඩ පාර නමින් හඳුන්වනු ලබන ප්‍රාදේශීය සභා පාර දිගේ කි. මී. 0.6ක් පමණ දුරක් ගමන් කරන්න. එකී පාරේ දකුණු අත පැත්තේ විෂයගත දේපළ පිහිටා ඇත.

ගැරඩා ඉන්වෙස්ට්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් කලින් පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් ලිමිටඩ් සහ පෑන් ඒෂියා බෑන්ක් ලිමිටඩ් යනුවෙන් හැඳින්වුන ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බෑන්කිං කෝපරේෂන් පීඑල්සී නමට කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් පී. එස්. එන්. රාජකරුණා විසින් ලියා සහතික කරන ලද වර්ෂ 2014.07.03 දිනැති අංක 5307 දරන ප්‍රාථමික උකස් බැඳුම්කරය මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2016.03.25 වැනි දින ඩේලි නිවුස්, ලක්බිම, සුඩර් ඔළි පුවත්පත් සහ එදින ගැසට් පත ද බලන්න.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතුය.

1. ගැනුම් මිලෙන් 10% ක් ද (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1% ක්ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2.5% ක් ද (සියයට දෙකහමාරක්)
4. ප්‍රචාරන වියදම් ද,
5. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු ද (රු. 3000),
6. ලිපිකරු හා සෝෂකගේ ගාස්තුව රු. 1,500 ද.

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30 ක් ඇතුළත ගැනුම් මිලේ පරිශේෂය වන 90% ක මුදල බැංකුවට ගෙවිය යුතුය. එකී 90% ක ඉතිරි මුදල දින 30 ක් ඇතුළත දී නොගෙව්වහොත් ගෙවා ඇති 10% ක මුදල අහිමි කිරීමට හා එකී දේපල නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාල තොරතුරු සඳහා කළමණාකරු - ණය අයකර ගැනීම් අංශය පෑන් ඒෂියා බෑංකින් කෝපරේෂන් පීඑල්සී ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලුපාර කොළඹ 03. දුරකථන : 011-4667266.

තුසිත් කරුණාරත්න,
උසාවි කොමසාරිස්, සහ බලයලත් වෙන්දේසිකරු

අංක 182/3(50/3), විහාර මාවත,
කොළොන්නාව.
දුරකථන : 011 - 3068185 ෆැක්ස් අංකය : 011- 2572940.

04-492

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.